රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 04/2014

මගේ අංකය : CS/HR/13/II

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,

නිදහස් චතුරශ්‍රය,

කොළඹ 07.

2014.05.24

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම් වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් සහ

රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත.

<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම.</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.12.24 දිනැතිව අංක:1372/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2004 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට 2013.12.11 දිනැතිව 1840/34 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය 2013.04.02 දින සිට ක්‍රියාත්මක වේ.

02. අන්තර්ග්‍රහණය.

ව්‍යවස්ථා සංග්‍රහයේ 14 වන වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව,

නියමිත දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II, I සහ අධිපන්ති වලට අයත් තනතුරුවල සේවය කරන නිලධාරීන් සියළුම දෙනා පහත සඳහන් පරිදි නව ව්‍යවස්ථාව යටතේ අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

මෙම අන්තර්ග්‍රහණය හේතුවෙන් නිලධාරීන් දැනට ලබන වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

(අ). නියමිත දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ සිටින නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ III ශ්‍රේණියට,

(ආ). නියමිත දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියේ සිටින නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ II ශ්‍රේණියට,

(ඇ). නියමිත දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ සිටින නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට,

(ඈ). නියමිත දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිපන්තියේ සිටින නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ අධිශ්‍රේණියට,

03. උසස්වීම්.

ව්‍යවස්ථා සංග්‍රහයේ 10 වන වගන්තිය යටතේ දැක්වෙන උසස්වීම් පරිපාටිය ද 08 වන වගන්තියේ දැක්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග ද 2013.04.02 වන දින සිට වලංගු වේ. එසේ වුව ද ඔවුන්ට 15 වන වගන්තියේ දැක්වෙන අන්තර්කාලීන විධිවිධාන වලට හිමිකම් ඇත. ( ව්‍යවස්ථා සංග්‍රහයේ ඇමුණුම 07 හා 08 අනුව උසස්වීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.)

04. වෙනත්.

(අ). ව්‍යවස්ථා සංග්‍රහයේ 09 වන වගන්තියේ දැක්වෙන විධිවිධාන පරිදි සෑම නිලධාරියෙකුම භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු වේ. ඒ අනුව 2007.07.01 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගන්නා ලද නිලධරයන් හට භාෂා ප්‍රවීණතාවය සමත් වීම් සම්බන්ධයෙන් 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හි විධිවිධාන අදාළ වේ.

(ආ). අංක 1840/34 හා 2013.12.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පිටපතක් ද මේ සමඟ එවමි.



පී.බී.අබේකෝන්

ලේකම්,

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය